දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංකය-: 19/12

මගේ අංකය-: බ13/01

බන්ධනාගාර මූලස්ථානය,

කොළඹ 09.

2012.07.05

සියළුම බන්ධනාගාර අධිකාරීන්/ සහකාර අධිකාරීන් වෙත,

**<u>ගිණුම් කටයුතු විධිමත් කිරීම - කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුම.</u>**

බන්ධනාගාර කාර්මික හා කෘෂිකාර්මික කටයුතු සම්බන්ධයෙන් පවතින වර්තමාන ගිණුම් පිළිවෙත පිළිබඳව යම් යම් ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා පහත පිළිවෙත් හා ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීම සුදුසු වේ.

1) **<u>බිල්පත් ප්‍රමාදය.</u>**

එදිනෙද නිම කරන පිරිවැය පත්‍ර වලට අදාලව වැඩ නිමවූ වහාම එදිනම පිරිවැය ගණනය කොට විකුණුම් වටිනාකම සකස්කොට බිල්පත් නිකුත් කල යුතු වේ. අදල ආයතනයට භාණ්ඩ භාරදෙන අවස්ථාවේදීම එම භාණ්ඩ සමගම ඒවාට අදල බිල්පත භාරදීමට කටයුතු කල යුතුවේ.

වැඩ නිම වූ පිරිවැය පත්‍රිකාවලට අදාලව පිරිවැය සකස් කිරීම, විකුණුම් මිල තීරණය කිරීම, සකස් කරන ලද බිල්පත් පරීක්ෂාව හා බිල්පත් නිකුත් කිරීමේ ප්‍රමාදයන් මගහරවාගෙන ඒ ඒ මාසයට අදල ආදයම් එම මාසය තුලදීම ගිණුම් වලට ඇතුලත් කිරීමට වගබලා ගත යුතුය.

2) **<u>පිරිවැය පත්‍රිකා නිකුත් කිරීම.</u>**

සෑම අවස්ථාවකදීම අදල කර්මාන්ත කාර්යාලය විසින් වැඩ අංශ සඳහා පිරිවැය පත්‍රිකා නිකුත් කරන විට යම් ආයතනයක වැඩ ඇනවුමක් සම්බන්ධයෙන් කිසියම් එක් භාණ්ඩ වර්ගයක් සඳහා එක් පිරිවැය පත්‍රිකාවක් නිකුත් කල යුතුය. කිසියම් අංශයක භාණ්ඩ වර්ග 2කට අදලව වූ ඇනවුමක් වන්නේ නම් එම භාණ්ඩ වර්ග දෙක සඳහා වෙන වෙනම පිරිවැය පත්‍රිකා නිකුත් කල යුතුය. යම් අංශයක් සඳහා සියළුම භාණ්ඩ වලට අදාලව එක් පිරිවැය පත්‍රිකාවක් භාවිතා කිරීමෙන් සියළුම භාණ්ඩ නිශ්පාදනය වනතුරු එකී භාණ්ඩයන්ගේ පිරිවැය ගණනය කිරීම ප්‍රමාද වීම වැලැක්වීමට කටයුතු කිරීම මෙහි අරමුණයි.

උදා-: කම්හල් අංශය

බාල්දි - එක් පිරිවැය පත්‍රිකාවක්

මුත්‍රා පෝච්චි - එක් පිරිවැය පත්‍රිකාවක්

3) **<u>ගිණුම් ඉදිරිපත් කිරීම (උපචිත පදනම)</u>**

යම්කිසි අදයමක් හඳුනා ගැනීමේදී හෝ වියදම් ගනන් ගැනීමේදී එම ආදයම මුදලින් ලැබුණාද, යන්න ගැන නොසලකා කාල පරිච්ඡේදය තුල උපලබ්ධිය ඇත්නම්, එම අදයම ගනන් ගැනීමත් වියදම සඳහා මුදල් ගෙවා තිබුණත්, නැතත් කාල පරිච්ඡේදයේ අදයම ඉපැයීමට එම වියදම අදල නම් එම වියදම ගනන් ගැනීමත් වේ.

උදා-: අප්‍රේල් මස රු.50,000.00ක් වටිනා අමුද්‍රව්‍ය සැපයුම්කරුවකුගෙන් ණයට ලබාගැනීම.

මෙහිදී ණයට ලබාගත් අමුද්‍රව්‍ය යොද භාණ්ඩ නිෂ්පාදනය කලද, එම වටිනාකම ඒ මාසයේ ආදයම් ඉපැයීමට අදල වියදමක් බැවින් රු.50,000.00ක අමුද්‍රව්‍ය වියදම අප්‍රේල් මස වියදමක් ලෙස ගිණුම් ගත කල යුතු වේ.

මෙහිදී ද්විත්ව සටහන් වනුයේ

1. ගැනුම් ගිණුම - හර රු. 50,000.00
   අදාල සැපයුම්කරු - බැර රු. 50,000.00
   (ණයට ගැනීම සටහන් කිරීම)

2. නිෂ්පාදන ගිණුම - හර රු. 50,000.00

   ගැණුම් ගිණුම - බැර රු. 50,000.00

   (අමුද්‍රව්‍ය ගැනුම් නිෂ්පාදන ගිණුමට මාරු කිරීම)

සැපයුම්කරුට මුදල් ගෙව්වේ මැයි මස නම්, ද්විත්ව සටහන වනුයේ,

1. අදල සැපයුම්කරු - හර රු. 50,000.00

   මුදල් පොත බැර - බැර රු. 50,000.00

   (සැපයුම්කරුට මුදල් ගෙවීම සටහන් කිරීම)

මෙහිදී ඔබ විසින් ගිණුම් සකස් කිරීමේදී ණය හිමි ගිණුමක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. සියළු ණයට ගැනුම් ණය හිමි ගිණුම හරහා සිදුකළ යුතු වේ. මෙහිදී උපචිත පදනමට ගිණුම් ගත කිරීමේදී ගැනුම් ගිණුම තුළ ණයට ගත් අමුද්‍රව්‍ය හා අත්පිට මුදලට ගත් අමුද්‍රව්‍ය වශයෙන් ගණුදෙනු වර්ග දෙකම සටහන් වේ.

4) (අ) **නොනිමි තොග වටිනාකම ගණනය කිරීම.**

මාසික, ත්‍රෛමාසික හා වාර්ෂික ගිණුම් සකස් කිරීමේදී ඒ ඒ වැඩ අංග වල වැඩ නිම නොකල පිරිවැය පත්‍රිකා වලට අදලව ඒ දක්වා වූ පිරිවැය ගණනය කොට එම වටිනාකම නොනිමි වැඩ වටිනාකමට ඇතුලත් විය යුතුවේ.

(ආ) **අවසාන තොග අගය කිරීම.**

අවසන් තොග අගය කිරීම වියයුත්තේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගය මත වේ.

උදා:- තොග වටිනාකම (පිරිවැයට) = රු. 50,000.00

තොග වටිනාකම (ශුද්ධ උපලබ්ධි අගයට) = රු. 60,000.00

මෙහිදී පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගය වූ රු. 50,000.00 තොග වටිනාකම ලෙස සැලකිය යුතුවේ.

5) **ඇනවුමක් මත පමණක් භාණ්ඩ නිපදවීම.**

කිසිදු ආයතනයක් වැඩ ඇනවුමක් නොමැතිව (D/O) වාචික නියෝග හෝ උපදෙස් මත හෝ වැඩ ඇනවුම් පසුව එවීමේ පදනම මත හෝ භාණ්ඩ හෝ සේවා සැපයීම නොකළ යුතු වේ.

6) **වැඩ ඇස්තමේන්තු අනුමත කරවා ගැනීම.**

කර්මාන්ත කාර්යාලය වෙත වැඩ ඇනවුමක් (Demand of Oder ) යැවූ පසු අදල ආයතනය විසින් ඊට අදල ඇස්තමේන්තුවක් ලබාගෙන එම ඇස්තමේන්තුවට අධිකාරී බලය ඇති අංශ වෙතින් අනුමැතිය හා ප්‍රතිපාදන වෙන්කරවා ගැනීම අනිවාර්ය වේ.

7) **නොමිලේ ලැබෙන අමුද්‍රව්‍ය යොද ගෙන නිපදවන භාණ්ඩ**

යම්කිසි ආයතනයක වැඩ අංග සඳහා ඉවතලන අමුද්‍රව්‍ය හා/ හෝ නොමිලේ ලැබෙන අමුද්‍රව්‍ය යොද ගෙන භාණ්ඩ නිෂ්පාදනය කරන්නේ නම්, එම අමුද්‍රව්‍ය යොද නිපදවන භාණ්ඩ තොගය ( නිමි තොගය) වටිනාකම් නොකර නාම මාත්‍ර තොගයක් ලෙස සටහන් යටතේ පෙන්වන්න. එම තොගය අගය කිරීමේදී ඒවා නිෂ්පාදනයට සිර ශ්‍රමය, ඉන්ධන ආදී පොදු කාර්ය පිරිවැය දරණ ලද්දේ නම්, එම පිරිවැය පමණක් ඇතුලත් කොට නිමි තොගය අගය කල යුතුවේ. අමුද්‍රව්‍ය සඳහා වියදම් ඇතුලත් වන්නේ නැත.

උදා: භාණ්ඩ 100ක් සඳහා නිෂ්පාදන වියදම

| | | | |
|---|---|---|---|
| අමුද්‍රව්‍ය වියදම | - | නැත. | |
| සිර ශ්‍රමය | - | 600.00 | |
| ඉන්ධන | - | 200.00 | |
| මුළු වියදම | - | 800.00 | |
| ඒකකයක පිරිවැය | - | 800.00 / 100 | රු.8.00 |

මේ අනුව භාණ්ඩ 100න් 25ක් 25 × 8 = රු.120

ඉතිරි තොග වන්නේ නම්, පිරිවැය.

මෙවැනි තත්ත්වයක් යටතේ විකුණුම් මිල තීරණය කිරීමේදී අමුද්‍රව්‍ය සඳහා යම් වටිනාකමක් ආරෝපණය කළ යුතු වේ. (එම භාණ්ඩය නිෂ්පාදනයට යොද ගන්නා අමුද්‍රව්‍ය සඳහා පවත්නා වෙළඳපොල මිල යොද ගත හැකිය.) ඒ අනුව ගණනය කරන ලද මුළු නිෂ්පාදන පිරිවැයට ලාභ ප්‍රතිශතය එක් කොට විකුණුම් මිල තීරණය කිරීම කළ යුතු වේ.

8) <u>ආදයම් හා වියදම් වාර්තා කිරීම - කෘෂි හා සත්ත්ව</u>

කෘෂිකර්මය හා සත්ත්ව පාලන කටයුතු වල නියැලෙන බන්ධනාගාර ආයතන විසින් තම මාසික ගිණුම් වාර්තාව ඉදිරිපත් කරන අවස්ථාවේදී කෘෂිකාර්මික අංශයට හා සත්ත්ව පාලන අංශයට අදළව වෙන වෙනම ආදයම්, වියදම් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුවේ.

උදා: සත්ත්ව පාලනය - ගව පාලනය, එළු පාලනය, කුකුළු පාලනය වශයෙන් වෙන වෙනම

ගොවිපල - තේ වගාව, පොල් වගාව, වී වගාව, එළවළු වගාව වශයෙන් වෙන වෙනම

ඉහත සඳහන් පරිදි කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදී, එය නිසි පරිදි සිදු වේදැයි අධීක්ෂණය කරන මෙන් දන්වමි.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

**පී.ඩබ්ලිව්. කොඩිප්පිලි**
**බන්ධනාගාර කොමසාරිස් ජනරාල්**
**බන්ධනාගාර මූලස්ථානය**
**කොළඹ 09.**